# බළන්ගොඩ නගර සභාව

## 2021-02-02 වන දිනැති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2021.02.02**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින විශේෂ මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 8. ගරු නාගරික මන්ත්‍රී | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රී | එම්.ඩබ්.විමලසිරි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 10. ගරු නාගරික මන්ත්‍රිනි | සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය |
| 11. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |

**නිළධාරි සහභාගීත්වය**

1. ප්‍රධාන කළමනාරිණ සේවා නිළධාරි ජී.ඩී.ඒ.සේමපාල මිය

ගරු සභාපතිතුමන් විසින් මෙදින විශේෂ මහ සභාව සඳහා සහභාගි වූ ගරු නාගරික මන්ත්‍රීවරුන් ඇතුළු සියළුම දෙනා පිළිගනිමින් ගරු සභාවේ වැඩකටයුතු ආරම්භ කරන ලදි. 2021 වර්ෂයට අදාළව පොදු වෙළෙඳසැල අංක 07,15 හා 16 දරණ කඩ කාමර ටෙන්ඩර් කිරීම සඳහා කැඳවන ලද ටෙන්ඩර් පත් විවෘත කිරීම වෙනුවෙන් මෙදින විශේෂ මහ සභාව පවත්වන බැවින් ඒ සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත්කරන ලදි'

ටෙන්ඩර් පත් විවෘත කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්කර ගන්නා ලදි.

ටෙන්ඩර් මණ්ඩලය විසින් අනුමත කරන ලද පහත සඳහන් තීරණ සියල්ල ගරු සභාපතිතුමන් විසින් නැවත වරක් ගරු සභාවට ඉදිරිපත් කරන ලදි.

- 2020 වර්ෂය සඳහා පොදු වෙළඳසැල් අංක 15 දරණ එළුමස් කඩ කාමරය සඳහා ටෙන්ඩර් පත් තුනක් නිකුත්කර තිබූ අතර, එම ලංසුපත් තුනම ලැබී තිබුණි. එහිදී රු. 45,100.00 ක වැඩිම ලංසු මුදල ඉදිරිපත් කර තිබූ එම්.එන්.එම්.රිස්වි මහතා විසින් එම ටෙන්ඩරය ප්‍රතික්ෂේප කළ බැවින් දෙවන ටෙන්ඩර්කරු වන එම්. මලික් මහතා විසින් ඉදිරිපත් කර තිබූ රු. 30,350.00 ක මාසික ලංසු මුදල පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදි.

- 2021 වර්ෂය සඳහා පොදු වෙළඳසැල අංක 16 දරණ ගවමස් කඩ කාමරය සඳහා ටෙන්ඩර්පත් තුනක් නිකුත්කර තිබූ අතර, එම ටෙන්ඩර්පත් තුනම ලැබී තිබුණි. එහිදී රු. 840,000.00 ක වැඩිම ලංසු මුදල ඉදිරිපත් කර තිබූ එම්. ඉරුෆාන් ඉන්ෆාර් මහතා විසින් එම ටෙන්ඩරය ප්‍රතික්ෂේප කල බැවින් දෙවන ටෙන්ඩර්කරු වන අංක 5, රංදොල, කිරිමැටිතැන්න පදිංචි එම්.එම්.නජීම් මහතා විසින් ඉදිරිපත් කර තිබූ රු. 756,000.00 ක මාසික ලංසු මුදල පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදි.

- පොදු වෙළඳසැල අංක 07 දරණ එළවලු කඩ කාමරය සඳහා ටෙන්ඩර්පත් හතරක් නිකුත් කර තිබූ අතර, ඒ අතරින් ටෙන්ඩර්පත් තුනක් පමණක් ලැබී තිබුණි. එහිදී රු. 15,101.50 ක වැඩිම ලංසු මුදල ඉදිරිපත් කර තිබූ එම්.කේ.යූ.සී.සුහසේන මහතා විසින් එම ටෙන්ඩරය ප්‍රතික්ෂේප කල බැවින් දෙවන ටෙන්ඩර්කරු වන ජී.ශාන්ත කුමාර මහතා විසින් ඉදිරිපත් කර තිබූ රු. 4,475.00 ක මාසික ලංසු මුදල පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදි.

ටෙන්ඩර් මණ්ඩලය විසින් අනුමත කරන ලද ඉහතින් ලබාගන්නා තීරණ සියල්ල ගරු සභාපතිතුමන් විසින් නැවත සභාවට ඉදිරිපත් කරමින් ගරු සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු

බවට කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

අද දින ගරු සභාව සාර්ථකව පවත්වා ගැනීමට සහයෝගය ලබාදුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය හා කාර්ය මණ්ඩලය සඳහා ස්තුතිව පුදකරමින් ප.ව. 12.00 ට පමණ විශේෂ මහ සභාවේ කටයුතු අවසන් කරන ලදි.

එම්.ටී.එම්.රුමි,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.